# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2126/21 - 2019 ජුනි මස 04 වැනි අඟහරුවාදා - 2019.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(xv) (අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින් (2019 පෙබරවාරි මස 18 වන දින අංක 2111/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත), 1984 ජනවාරි මස 24 වන දින අංක 281/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සහ ශ්‍රී ලංකා රුහුණ විශ්වවිද්‍යාලය පිහිටුවමින්, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "කළමනාකරණ හා මූල්‍ය පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "3. අලෙවිකරණ අධ්‍යයනාංශය" යන සටහනට ඉක්බිතිවම පහත දැක්වෙන සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"4. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය".

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ජුනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

06 - 530


1A - PG 4544 — 518 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*